නාරම්මල ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
--------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 03 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 අගෝස්තු 12 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට නාරම්මල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය සඳහා සමාලෝචිත වර්ෂයේ සිව්වන කාර්තුව වෙනුවෙන් ගෙවිය යුතු රු.495,296 ක් වූ පොලිය 2016 වර්ෂයේ ගෙවා තිබූ අතර එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ වියදම් හා ණයහිමි වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයට අදාල රු.33,467 ක මුද්දර ගාස්තු ගෙවීමේදී වැරදීමකින් මුද්දර ගාස්තු ණයහිමි ගිණුම වෙනුවට සාමාන්‍ය ණයහිමි ගිණුමට හර කිරීම නිවැරදි කිරීම සඳහා ජර්නල් 63 මඟින් ණයහිමි ගිණුම වෙනුවට සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.

(ඇ) පොදු ගිණුමෙන් යටිතල පහසුකම් ගිණුමට මුදල් මාරු කිරීමේදී අත්තිකාරම් ලෙස ගිණුම්ගත නොවූ රු.4,446 ක මුදල ජර්නල් සටහන් 70 මඟින් පොදු ගිණුමට බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.

(ඈ) රු.3,200 ක පෙර වර්ෂයට අදාළ අත්තිකාරම් මුදල් ගෙවීමක් නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් 71 මඟින් සමුච්චිත අරමුදල බැරකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ රු.4,900 ක සිමෙන්ති බ්ලොක්ගල් මිලදී ගැනීමේ වියදම 2016 වර්ෂයේදී ගෙවා ඇතත්, සමාලෝචිත වර්ෂයේ අදාල වියදම් ගිණුමට හා ණයහිමි ගිණුමට ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයන්ට අදාල නමුත් එම වර්ෂයේදී ප්‍රතිපාදන සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු. 245,993 ක මුදල වර්ෂයේ වියදම් ලෙස සලකා ගිණුම්වලට ගෙන තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(ඌ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව මඟින් හඳුන්වා දී ඇති ප්‍රා.ස 07 හා ප්‍රා.ස 19 ආකෘති භාවිතයෙන් තොරව අවසන් මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 03 කට අදාල ශේෂයන් හා ඊට අනුරූපී, උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු.163,341 ක නොසැසඳීම් පැවතුණි.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 21,312,454 ක් වූ අතර ඒ තුළ දීර්ඝ කාලයක සිට පවතින තොරතුරු ඉදිරිපත් නොවූ රු.10,000 ක සභාව විසින් කළ තැන්පත් ශේෂයක්ද, වසර 03 ට වැඩි අයවිය යුතු රු.120,641 ක ශේෂයක්ද පැවතුණි.

**1.3.4 ගෙවිය යුතු ගිණුම්**

2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 17,392,916 ක් වූ අතර වසරකට වැඩි කාලයක් නිරවුල් නොවූ රු.9,132,202 ක ණය ශේෂයන් ඒ තුළ ඇතුළත්ව තිබුණි.

**1.3.5 නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව සභාවේ වසර 2 ඉක්මවූ රු.548,419 ක තැන්පත් ශේෂ 33 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**02 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,721,080ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.6,344,444ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,623,364 ක පිරිහීමක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.21,265,782 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.24,056,922 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.1,929,940 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | 2014 | විචලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 22,658 | 25,697 | (3,039) | පෞද්ගලික පඩිනඩි | 54,524 | 40,713 | 13,811 |
| (ii) | වෙනත් | 65,637 | 52,159 | 13,478 | අනෙකුත් | 29,049 | 30,799 | (1,750) |
| | උප එකතුව | 88,295 | 77,856 | 10,439 | උප එකතුව | 83,573 | 71,512 | 12,061 |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 21,266 | 189,534 | (168,268) | ප්‍රාග්ධන වියදම | 24,057 | 193,015 | (168,958) |
| | මුළු එකතුව | 109,561 | 267,390 | 157,829 | මුළු එකතුව | 107,630 | 264,527 | 156,897 |
| | මෙහෙයුම් ප්‍රතිඵලය | 4,721 | 6,344 | (1,623) | අතිරික්තය/ ඌනතාවය | 1,930 | 2,863 | (933) |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.88,294,306 න් සියයට 71 ක් හෙවත් රු.62,970,388 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.21,265,782 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.83,573,225 න් සියයට 65 ක් හෙවත් රු.54,524,129 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් සියයට 84 ක් හෙවත් රු.45,978,172 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබුණි. එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.24,056,921 න් සියයට 20 ක් වූ රු..4,984,733 ක මුදල් පමණක් සභා අරමුදලින් වැය කර තිබු අතර ඉතිරි සියයට 80 ක් වූ රු.19,072,188 ක මුදල ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන මත ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂ හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| ආදායම් විෂයය | 2015 ඇස්තමේන්තු ගත | 2015 තත්‍ය | 2015 දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | 2014 ඇස්තමේන්තු ගත | 2014 තත්‍ය | 2014 දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 5,885 | 4,794 | 1,331 | 4,736 | 4,733 | 1,180 |
| (ii) බදුකුලී | 21,834 | 13,830 | 246 | 16,486 | 16,207 | 186 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,206 | 3,877 | - | 1,658 | 1,658 | - |
| (iv) වෙනත් ආදායම් | 61,993 | 61,792 | 11,506 | 48,676 | 48,837 | 12,217 |
| එකතුව | 91,918 | 84,293 | 13,083 | 71,556 | 71,435 | 13,583 |

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වරිපනම් හා බදු යටතේ සමාලෝචිත වර්ෂයට අදාළ රු.5,885,500 ක ආදායමක් ඇස්තමේන්තු කර පැවතියද, එයින් අයකර තිබුණේ රු. 4,794,355 ලෙස සියයට 81 පමණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.1,331,813 ක හිඟයක් පැවති අතර එය වාර්ෂික බිල් කිරීම්වලින් සියයට 27 ක් විය.

(ආ) බදු කුලී යටතේ සමාලෝචිත වර්ෂයට අදාළ රු 21,834,000 ක ආදායමක් ඇස්තමේන්තු කර පැවතියද, එයින් අයකර පැවතියේ රු 13,830,463 ලෙස සියයට 63 පමණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 246,796 ක හිඟයක් පැවති අතර එය වාර්ෂික බිල් කිරීම්වලින් සියයට 1.1 ක් විය.

### 2.3.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම් | එකතුව | 2015/01/01 දක්වා හිඟයෙන් | ආදායම් රැස් කිරීම බිල්කළ ආදායමින් | එකතුව | 2015/01/01 දිනට පැවති හිඟයෙන් | බිල්කළ ආදායමින් | හිඟහිටි ශේෂය 2015/12/31 දිනට ගණනය කිරීම් අනුව ශේෂය | 2015/12/31 දිනට මුළු හිඟය (මූල්‍ය ප්‍රකාශන අනුව) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු.000 | රු. 000 |
| වරිපනම් හා බදු | 1,292,952 | 4,458,430 | 5,751,382 | 877,533 | 4,312,057 | 5,189,590 | 415,419 | 146,373 | 561,792 | 1,331,813 |
| බදු කුලී | 188,368 | 10,217,438 | 10,405,806 | 184,968 | 9,891,524 | 10,076,492 | 3,400 | 325,914 | 329,364 | 246,796 |
| බලපත්‍ර ගාස්තු | - | 2,552,576 | 2,552,576 | - | 2,552,576 | 2,552,576 | - | - | - | - |
| වෙනත් ආදායම් | 12,217,080 | 596,810 | 12,813,890 | 12,217,080 | 3,720,299 | 15,937,379 | - | - | - | 11,506,750 |
| එකතුව | 13,698,400 | 17,825,254 | 31,523,654 | 13,279,581 | 20,476,456 | 33,756,037 | 418,819 | 472,287 | 891,156 | 13,085,359 |

සභාවේ ආදායම් ලේඛන පවත්වාගෙන යාමේ අඩුපාඩු හේතුවෙන් ගණනය කිරීම අනුව 2015 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂයන් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ශේෂයන් සමඟ නොසැසඳුණි.

**2.3.3 ආදායම් පරිපාලනය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉදිකර තිබුණු දුරකතන සම්ප්‍රේෂණ කුළුණු 15 සඳහා 2015 වර්ෂය තුළ වෙළඳ බලපත්‍ර ආදායම් හෝ ව්‍යාපාර බදු අයකර නොතිබුණි. මේ හේතුවෙන් සභාවට රු.45,000 ක බලපත්‍ර ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ 2012/2013 වර්ෂවල සිට බදු දීමට නොහැකිව තිබූ වත්කම් විෂයයන් 09 ක් පැවති අතර වර්ෂ ගණනාවක සිට මෙම වත්කම් වලින් කිසිදු ආදායමක් උපයා නොතිබිණි. එසේම බදු දියහැකි තත්ත්වයට දේපල සංවර්ධනය කිරීමට හෝ එම දේපල වලින් ආදායමක් ඉපැයීමට හෝ සභාව විසින් සමාලෝචිත වර්ෂය දක්වාම පියවර ගෙන නොතිබුණි.

(ඇ) සභාවට අයත් නාරම්මල ප්‍රජා ශාලාව 2014 දෙසැම්බර් 26 දිනැති ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව අයකළ හැකි ගාස්තු අය කිරීමකින් තොරව අවස්ථා 24 කදී කුලියට ලබාදී තිබුණු අතර සභාවට අහිමිවූ ආදායම රු.117,000 ක් විය.

**2.3.4 උසාවි දඬ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඬ ප්‍රමාණය රු.940,034 ක්ද මුද්දර ගාස්තු රු.10,566,716 ක්ද විය.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ 2015 වර්ෂයේදී තනතුරු 06 ක පුරප්පාඩු 08 ක් හා තනතුරු 13 ක අතිරික්තතා 26 ක් විය.

(ආ) සභාවේ රාජකාරි පැවරීම් පරීක්ෂාවේදී නියමිත තනතුරට අදාළ රාජකාරි පවරා නොමැති අවස්ථා 15 ක් විය.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

සභා බල ප්‍රදේශය තුළ දුරකතන සම්ප්‍රේෂණ කුළුණු 13 ක් ඉදිකර පැවතියද, එම සියළුම කුළුණු ඉදි කිරීම සඳහා සංවර්ධන බලපත්‍රයක් ලබාගෙන හෝ අනුකූලතා සහතික ලබාගැනීමක් සිදුකර නොතිබූ අතර ඒ සඳහා සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

දැළිකුණු අංග සායන මධ්‍යස්ථානයට ජලය ලබාදීමේ කර්මාන්තයේ වැඩ විෂයය අංක R – 03 යටතේ මි.මී (1') PVC ටයිප් 1000 වර්ගයේ බට මීටර් 70 ක් සපයා සවි කිරීම සඳහා රු.28,560 ක් ගෙවා තිබුණද, ටයිප් 600 වර්ගයේ PVC පයිප්ප සවිකර තිබූ බව 2015 සැප්තැම්බර් 08 දින කරන ලද භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

## 04 යහපාලනය හා ගිණුම්කටයුතු භාවය

### 4.1 වත්කම් කළමනාකරණය

#### 4.1.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් නිශ්චිත ප්‍රදාන භාවිතා කර නාරම්මල පුස්තකාල ගොඩනැගිල්ලේ වහලය සඳහා 2014 වර්ෂයේ සාදා නිමකර තිබුණු රු.198,800 ක් වටිනා කාප්ප 08 ක් 2015 ඔක්තෝබර් මාසය වන විටත් අදාල කාර්යය සඳහා භාවිතා නොකර ප්‍රජාශාලා ගොඩනැගිල්ලේ පිටුපස දමා තිබුණි.

(ආ) 2010 වර්ෂයේ රු.265,000 කට මිලදී ගෙන තිබුණු කුට්ටි ගල් යන්ත්‍රය හා එම නිෂ්පාදිත ගල් ඇතිරීම සඳහා සකස් කළ 2'x1' ප්‍රමාණයේ ලෑලි කට්ටු 360 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

## 05 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය